www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී-20 සමුලුවේ දී වඩාත් ස්ථිරව ප්‍රකාශිත වූ චීන රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම්

## More assertive Chinese diplomacy at the G20 summit

**ජෝන් චාන් විසිනි**

**2009 අප්‍රේල් 08**

මෑතක දී ලන්ඩනයෙහි පවත්වන ලද ජී-20 නමින් හඳුන්වන රටවල සමුලුවෙහි වැදගත් ලක්ෂනයක් වූයේ චීනය විසින් ඉටු කරන ලද වඩාත් බලවත් භූමිකාවයි. ලෝක කරලියේ තම රටෙහි වර්ධනය වන ආර්ථික ශක්තිය හා බලපෑම සම්බන්ධ මනා වැටහීමකින් යුත් බීජිං පාලන තන්ත්‍රය, ගැඹුරු වන ගෝලීය ආර්ථික පසුබෑම මධ්‍යයේ සිය ආසක්තයන් සැලකිල්ලට ගනිමින් ප්‍රධාන බලවතුන් අතර තමන්ට තැනක් ලබා ගැනීමට දැඩි අවධානයක් යොමු කලේ ය.

ඇමරිකානු මූල්‍ය ප්‍රාග්ධනය වෙනුවෙන් කථාකරන *වෝල්ස්ට්‍රීට් ජර්නලය* මන්දගාමී රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම්වලින් චීනය ඉවත් වෙමින් සිටින බව සටහන් කලේ ය. ''චීනයෙහි නිල මාධ්‍ය, ජී-20 සමුලුව උද්‍යෝගිමත් ලෙස සමාලෝචනය කර තිබේ. එහි දී චීන ජනාධිපති හූ ජින්ටාවෝ සිය ජාතියෙහි තත්වය ඉහල නැංවූ අතර තමන්ට ගෞරවාන්විතව ඇහුම් කන් දීමට ධනවත් රටවලට බල කෙරී තිබුනු බව තම මාධ්‍ය තුල පැහදිලි කලේය.

චීනය ජීආර්අයිසී (බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, හා චීනය) කන්ඩායමේ නායකයා වශයෙන් විචිත්‍රව විස්තර කරමින් චීනයේ පීපල්ස් ඩේලි නිල වෙබ් අඩවිය ජී-20 සමුලුව පුලුල් ලෙස ආවරනය කලේ ය. ස්ථාපිත බලවතුන්ට එරෙහිව මෙම නැගී එන ආර්ථිකයන්ගේ ආසක්තයන් සැලකිල්ලට ගන්නා ජාත්‍යන්තර ආර්ථිකයේ නව පර්යායක් යලි ගොඩනැගීමට චීනය උත්සුක වන බවට එමගින් පැහැදිලි කෙරුනි.

එසේ වුවද, චීනය තව දුරටත් විසංවාදී ප්‍රපංචයක්ව පවතී. ලොව තෙවැනි විශාලතම ආර්ථිකය වශයෙන් චීනය, ස්ථාපිතව ඇති කාර්මික රටවල් 7 කන්ඩායමේ ඇතැම් රටවල් අගුටුමිට්ටන් බවට පත් කරයි. එනමුදු ඒක පුද්ගල දල දේශීය නිෂ්පාදිතය අතින් තවමත් එය ශ්‍රේනිගත වන්නේ බොලීවියාව, මොරොක්කෝ, ඉන්දියාව හා සිරියාව සමග එක පෙලට ය. ලොව විශාලතම විදේශ මුදල් සංචිත බීජිං සතුය. එනමුදු මේවා උකහා ගනු ලබන්නේ ආයෝජන ප්‍රාග්ධනය හා වෙලඳ පොලවල් සඳහා දැනට සිටිනා බලවතුන් මත යැපෙන විශාල ලාභ ශ්‍රම සැපයුම් වේදිකාවක් ලෙස එහි තත්ත්වය තුලිනි.

මෙම ශක්තීන් හා දුර්වලතා නායක සමුලුව වටා ගොඩනැගුනු විවාද තුලින් ප්‍රකාශිත විය. සිය සංචිතයන්ගෙන් බොහොමයක් එක්සත් ජනපද බැඳුම්කර හා අනෙකුත් ඩොලර්වලින් ගනනය කරනු ලබන වත්කම් මත ආයෝජනය කර ඇති තත්ත්වයක සිටින බීජිං පාලන තන්ත්‍රය තුල, පහසුවෙන් බිඳී යාහැකි ඇමරිකානු මූල්‍ය පද්ධතියත්, පලුදුවිය හැකි එක්සත් ජනපද ඩොලරයත් එහි අවධානයට යොමුව ඇති ප්‍රධාන කරුනු වේ.

නායක සමුලුව පැවැත්වීමට ආසන්නව තිබිය දී, ගෝලීය සංචිත මුදල වශයෙන් එක්සත් ජනපද ඩොලරයට ආදේශකයක් සඳහා කැඳවුම් කරමින් චීන මහ බැංකු අධිපති සෝ සියාචෝචුවාන් ලිපියක් සම්පාදනය කලේ ය. ඒ, එක්සත් ජනපද ආන්ඩුවේ දැවැන්ත නය පියවාගැනීම සඳහා ඩොලර් අච්චු ගැසීමට එක්සත් ජනපද මහා ආන්ඩු සංචිත මන්ඩලය ගත් තීරනය ඩොලරයේ වටිනාකම පහත මට්ටමකට ඇද හෙලනු ඇතැයි යන බිය මධ්‍යයේ ය.

ආසක්තව ඇති මූලය යුද්ධය ''සම්බන්ධයෙන් මෙම ලිපිය, චීනය තුල තව දුරටත් විවාදයක් අවුලුවීය. ''මූල්‍ය යුද්ධය'' වූ කලි ගෝලීය සංචිත මුදල් වශයෙන් එක්සත් ජනපද ඩොලරය වෙනුවට රත්රන් ආදේශ කල යුතු බව ඉල්ලමින් පසුගිය වසරෙහි කරන ලද ඉතා ඉහල අලෙවියක් තිබූ කෘතියක නමයි. අර්බුදය වෙනත් අය මත පැටවීමට එක්සත් ජනපදය, ඩොලරයෙහි තත්ත්වය උපයෝගි කර ගැනීම සම්බන්ධයෙන් පිලිකුලක් දක්වන මෙම කෘතිය ගෝලීය මුදල් පිලිබඳව ඉදිරියට එන ගැටුම ගැන කථා කරයි. ගෝලීය පසුබෑම ගැඹුරුවත්ම, තමන්ට පාඩු විඳීමට සිදුවන බවට චීන ව්‍යාපාරික කොටස් අතර වර්ධනය වන බිය හා ඉච්ඡාභංගය ද බීජිං පාලන තන්ත්‍රය විසින් තම ලාභ අරමුනු රැක දිය යුතු බවට කෙරෙන ඔවුන්ගේ ඉල්ලීම් මෙම කෘතිය පිලිබිඹු කරයි.

බීජිං පාලන තන්ත්‍රය ක්‍රියාත්මක වීමට පටන් ගෙන ඇත. නියක සමුලුව මුවවිට දී ඩොලර් බිලියන

10ක මූල්‍ය හුවමාරුවකට චීනය, ආර්ජන්ටිනාව සමග ගිවිසුම් අත්සන් කලේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් චීනයෙන් කරනු ලබන සිය අයාත සඳහා ආර්ජන්ටිනාවට ඩොලර් වෙනුවට යුවාන් මුදලින් ගෙවිය හැක. දකුනු කොරියාව, මලයාසියාව හා ඉන්දුනීසියාව සමග ද චීනය, එවැනිම ගනුදෙනු වලට ඇතුලු වී ඇත. මේ හේතුවෙන්, ආසියාව අවසානයේ දී ''යුවාන් කන්ඩායමක්'' වීමට ඉඩ ඇතැයි යන මතය පල කිරීමට ඇතැම් විශ්ලේෂකයින් ඉදිරිපත් වී සිටියි.

එසේ වුව ද, ඩොලර් වත්කම් අතහැර දැමීම තුලින් ගෝලීය මූල්‍ය කඩා වැටීමකට ඩොලරයේ තත්ත්වය මග පෑදීමට චීනයට අවකාශයක් නොමැත. ''එක්සත් ජනපදය ආරක්ෂා කරන අවසන් ගිනි පවුර ලෙස ඩොලරයේ තත්ත්වය'' විස්තර කරමින් අප්‍රේල් 3 වැනි දා පීපල්ස් ඩේලි පුවත්පත මෙසේ අනතුරු ඇඟවී යඃ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය වඩාත් සුරක්ෂිත කෙම්බිමක් සොයාගෙන තිබුනේ නම්, පසුගිය ශතවර්ෂයෙහි මහා අවපාතයෙහි ඛේදවාචකය යලි සිදු කරමින්, ජාත්‍යන්තර ප්‍රාග්ධනය පිටතට ගලායමින් එක්සත් ජනපද වෙලඳපොලවල් අඩාල කිරීමට ඉඩ තිබුනි.''

වැඩි හයියක් පෙන්වීම සඳහා හිමිකම් ප්‍රකාශ කරමින් චීනය, ''වගකිවයුතු බලවතකු'' බව ජනාධිපති හූ, ජී-20 කන්ඩායම් සමුලුවට පැවසීය. එනම්, ගෝලීය ධනේශ්වර පර්යාය ආරක්ෂා කිරීම පිලිබඳව චීනයට ඕනෑකමක් තිබේ යන්නය. ඩොලරයේ භූමිකාව පිලිබඳ ප්‍රශ්නය ඔහු ඉදිරිපත් කලේ නැත. එමගින්, තවමත් චීනයෙහි විශාලතම නිර්යාත වෙලඳපොල වන එක්සත් ජනපදය සමග සෘජු ගැටුමක් වලකා ලී ය. තවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) තුල වඩා බලවත් නියෝජනයක් හිමි කර ගැනීම සඳහා තමන්ට වොෂින්ටනයෙහි සහාය අවශ්‍ය වන බව චීන නායකයෝ අවබෝධ කර ගෙන සිටිති.

ආර්ථික දුෂ්කරතාවලට මුහුන දී සිටින රටවලට එම තත්ත්වයෙන් ගොඩ ඒම පිනිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අරඹන ලද ඩොලර් බිලියන 500ක අරමුදලට චීනය ලබා දීමට පොරොන්දු වූයේ ඩොලර් බිලියන 40ක් පමනි. මෙය යුරෝපා සංගමය හා ජපානය දායක වීමට ප්‍රතිඥා දුන් ප්‍රමානයට වඩා බොහෝ සෙයින් අඩු ය. යුරෝපා සංගමය හා ජපානය වෙන වෙනම ඩොලර් බිලියන 100 බැගින් ලබා දීමට ප්‍රතිඥා දුනි. චීනය සිය දායකත්වය සීමා කලේ තමන් පුලුල් ලෙස පැතිරුනු දුප්පත්කමට මුහුන දෙන සංවර්ධනය වෙමින් පවතින රටක් බව අවධාරනය කරමිනි. 2000 වසරේදී අවසන් කිරීමට නියමිත සමාලෝචනයක කොටසක් වශයෙන් වඩාත් ප්‍රභල ඡන්ද අයිතියක් වෙනුවෙන් බීජිං පාලන තන්ත්‍රය ජී-20 සමුලුවෙහි දී පොදු එකගතාවක් ලබා ගැනීමට සමත් විය. ඊට හිලව් වශයෙන්, වඩාත් බලගතු උත්තේජන පියවර ගැනීම වෙනුවෙන් එක්සත් ජනපදයෙන් ඉදිරිපත් වූ ඉල්ලීමට චීනය උපාමාර්ගිකව සහාය දුනි. මෙය යුරෝපා බලවතුන් සමග ආතති සහගත තත්ත්වයක් ඇති වීමට හේතු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තුල චීනයේ ඡන්ද අයිතිය වැඩිවීම නිසැකව ම යුරෝපා බලවතුන්ට අවාසි සහගත තත්ත්වයකි.

චීන රාජ්‍ය මාධ්‍ය එක්සත් ජනපද ජනාධිපති බරක් ඔබාමා සමග හූගේ හමුව ඉදිරිපත් කලේ ''ජී-2'' නායක සමුලුව ලෙස ය. ඒ, යුරෝපා බලවතුන් ඉවත තබමින් එම ආර්ථිකයන් දෙකට පමනක් ගෝලීය ආර්ථික අර්බුදය විසඳලිය හැකි බව පෙන්වීම සඳහා ය. වාර්තාගත අන්දමට ඩොලර් පිලිබඳ ප්‍රකාශය ගැන හූ සඳහන් කලේ නැත. මූල්‍ය ප්‍රශ්න සම්බන්ධයෙන් කලින් සිටි බුෂ් පාලන තන්ත්‍රය විසින් මුල පුරන ලද සංවාදයක් පුලුල් කරමින් මේ වසරෙහි දෙවැනි භාගයෙහි චීනයේ සංචාරය කිරීමට 'එක්සත් ජනපද-චීන මූලෝපායික හා ආර්ථික සංවාදයක්'' ගොඩ නැගීමටත් ඔබාමා පොරොන්දු විය.

යුරෝපා බලවතුන් සමග සබඳතා විසංවාදී ස්වරූපයක් ගත්තේ ය. පසුගිය වසරෙහි රටින් පිටුවහල් කරන ලද දලයිලාමා සමග සාකච්ඡා සඳහා ප්‍රාරම්භක ඇරයුම් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් චීනයෙහි දැඩි දෝෂ දර්ශනයට ලක්වූ ප්‍රන්ස ජනාධිපති නිකොලායි සාර්කෝසි හමුවීමට හූ මුලින් සැලසුම් කොට තිබු අවසන් මොහොතේ දී ඔහු සාර්කෝසි හමුවූයේ ටිබැට් රටට කුමන ආකාරයේ හෝ නිදහසක් හෝ ප්‍රතික්ෂේප කිරීමට ප්‍රන්සය එකගවීමෙන් පසුව පමනි.

එසේ වුව ද, ඉක්මනින්ම ආතතීන් පැන නැග්ගේ ය. ජී-20 සමුලුව අතරවාරයේ නොයෙකුත් බදු සහන සලසා දී ඇති බදු කෙම්බිම් සේ සලකන රටවල අපලේඛන ගතකිරීම සඳහා ප්‍රන්සයේ ඉල්ලීමට හූ ප්‍රතිරෝධය දැක්වීය. චීනයට වැදගත්වූ මූල්‍ය කේන්ද්‍රස්ථාන දෙකක් වන හොංකොං හා මැකාව් එම බදු කෙම්බිම්වලට ඇතුලත් විය. මේ කලකෝලාහලය අවසන් වූයේ සම්මුතියක් ඇති කිරීමට ඔබාමා අතරමැදියකු ලෙස මැදිහත් වීමෙන් පසුව පමනි. ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය පිලබඳ සංවිධානය (ඕඊසීඩී) විසින් සකස් කරන ලද ලේඛනය ''අනුමත කරනු'' වෙනුවට ජී-20 සමුලුව, එයට අවධානය ''යොමු කරනු ඇත''. හොංකොං හා මැකාව් යන රටවල් එම ලේඛනයට ඇතුලත් නොවීය. සංවර්ධන ආයතනවලට වැඩිපුර වෙලඳ නය හා අරමුදල් සම්පාදනය ඇතුලු ජී-20 සමුලුවේ අනෙකුත් තීන්දු චීනයෙහි අවශ්‍යතාවනට ගැලපුනි. මෙයට අමතරව ජී-20 සමුලුවේ සාමාජිකයන් හරිත ව්‍යාපෘතීන් සඳහා වැඩිපුර වියදම් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දීමට උත්සාහ කල බ්‍රිතාන්‍යයේ ප්‍රයත්නය අවහිර කිරීමට හූ සමත් විය. ලොව විශාලතම පරිසර දූෂකයා වන චීනයට මෙය වැඩියෙන්ම බලපාන්නට ඉඩ තිබුනි.

චීන පාලක කවයන් අතර හූ ලත් රාජ්‍යතාන්ත්‍රික වාසි සාර්වත්‍රිකව උනුසුම් පිළිගැනීමකට ලක් වී නොමැත. චීන ධනවාදය දැවැන්ත අර්බුදයකට මුහුන දෙන බවට බිය පල කරන අර්ථ ශාස්ත්‍රඥයින් ගනනාවක් කියා සිටින්නේ චීනය සිය ජාත්‍යන්තර භූමිකාව පුලුල් කිරීමට උනුසුම් වීම වෙනුවට රට අභ්‍යන්තරය පිලිබඳව සිය අවධානය යොමු කල යුතු බවය. චීන නායකත්වය රටින් පිටස්තරව අනවශ්‍ය ලෙස මුදල් වැය කරන බවත් රට අභ්‍යන්තරහෙි පුලුල් ලෙස පැතිරුනු සමාජීය කැලඹිලි ඇතිවීමේ තර්ජනය ගැන උත්සුක නොවන බවටත් ඔවුහු තර්ක කරති.

කැබිනට් මන්ඩලයෙහි ආර්ථික උපදේශකයෙකු වන ටැන් මිං ෂයිනා ඩේලි පුවත්පතට මෙසේ පැවසීය: ''චීනයෙහි ආර්ථිකය ඇතැමුන් සිතන තරම් ශක්තිමත් එකක් නොවේ. ලොව වටා රැකියාවන් අහිමි වූ මිලියන 50ක ජනතාවගෙන් මිලියන 20ක් - එනම්, අන් කිසිදු රටකට වැඩි සංඛ්‍යාවක් - මූලික වශයෙන් නිර්යාතවලට නැඹුරු වූ නිෂ්පාදන අංශයෙහි රැකියාවන්වල යෙදුනු චීන ජනතාව ය.'' විශාල ලෙස මුදල් පොම්ප කර සහන සැලසීමෙන් චීනය ගලවාගැනීම වෙනුවෙන් ප්‍රමුඛත්වය දිය යුතු යයි ඔහු අවධාරනය කලේය. විශාල පරිමානයේ උත්තේජක පියවර ගෙන තිබුන ද 2009 වසරේ ප්‍රථම දෙමාසයේ වාර්ෂික අනුපාතයකින් සලකන කල චීනයේ කාර්මික ආයතනවල ලාභය සියයට 37කින් පහත වැටුනි. මෙහි ප්‍රමුඛත්වයක් ගත්තේ නිර්යාතවල කැපීපෙනෙන පහත වැටීම යි.

මෑතම දත්තවලට අනුව,නගවල සේවය කල සංක්‍රමනික කම්කරුවෝ වැඩිපුර මිලියන 11ක් ද ගම්බද පලාත්වලට ආපසු පැමිනි මිලියන 12ක් ද විරැකියාවෙන් පෙලෙති. තවද නාගරික කම්රුවන් අතර නොසංසුන්තාවය ද වැඩි වෙමින් පවතී. නිදසුනක් වශයෙන් හෙවෙයි පලාතේ බවෝමිං නුවර යිමියන් සමූහයට අයත් 3,000-4,000 අතර කම්කරු පිරිසක් එම රාජ්‍ය ව්‍යාපාරික ආයතනය පුද්ගලීකරනය කිරීමට විරෝධය දක්වමින් සතියක් කම්හල තුල වාඩි ලා ගත්හ.

එසේ වුව ද, ගෝලීය ධනවාදයෙහි ගැඹුරු අර්බුදය පිලිබඳව චීන නායකත්වය සවිඥානකය. ජී-20 සමුලුවෙහි අනිකුත් බලවතුන් මෙන්ම බීජිං පාලන තන්ත්‍රය ද ආර්ථික බර සිය ප්‍රතිමල්ලවයන් මත පැටවීමට උත්සුක වෙයි. මේ ක්‍රියාවලිය වර්ධනය වන ආතතීන් හා ගැටුම්වලට මග පාදයි.

© www.wsws.org